# 6 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

# දෙවන වාරය



මෙම රූපය දෙස බලන්න...ඔබට සිහියට නැගෙන්නේ කුමන අවස්ථාවක්ද?

ඔව්...සිංහල අලුත් අවුරුදු කාලය....එම අවුරුදු කාලයේදී ඔබ සිදු කරන විශේෂ දේ සිහියට නගා ගන්න...ඒ විශේෂ දේ අතරින් ඔබ වඩාත්ම කැමති විනෝදාත්මක ජන ක්‍රීඩා කිරීමට බව අප දන්නවා.....

01..සිංහල අලුත් අවුරුද්දට විශේෂයෙන් කරනු ලබන ජන ක්‍රීඩා මොනවාද?

02..එම ක්‍රීඩා අතරින් ඔබ සහභාගී වී ඇති ජන ක්‍රීඩා මොනවාද?

03..එම ක්‍රීඩා අතරින් ගීත ගායනා කරමින් කරන ජන ක්‍රීඩා මොනවාද?

04..ජන ක්‍රීඩා අතරින් කාන්තාවන් පමණක් සහභාගී වන ක්‍රීඩා මොනවාද?

05..ගෘහස්ථව සිදු කරන ජන ක්‍රීඩා මොනවාද?

දැන් අපි දේශීය ජන ක්‍රීඩා පිළිබඳව කෙටි විස්තරයක් අධ්‍යයනය කරමු...

අතීතයේ සිටම පොදු ජනයා විනෝදාස්වාදය සඳහා ජන ක්‍රීඩාවල යෙදී ඇත.එම ජන ක්‍රීඩා පොල් කෙළිය,අංකෙළිය,පනා හැංගීම, මුදුහැංගීම,හවරිහැංගීම,ඔළිඳකෙළිය,මේවරකෙළිය,එළුවන්කෑම, කළගෙඩි සෙල්ලම ආදී වශයෙන් වර් ග කළ හැකිය.

මෙම ක්‍රීඩා සිංහල ජන සමාජය තුළ ප්‍රචලිත ක්‍රීඩාවන්ගෙන් සමහරකි.

එම ජන ක්‍රීඩා අතරින් ඔළිඳ කෙළිය,මේවර කෙළිය,එළුවන් කෑම, කළ ගෙඩි සෙල්ලම,යන ක්‍රීඩා පිළිබඳව විමසා බලමු...

# දේශීය ජන ක්‍රීඩා ආශ්‍රිත ගීත



ඉහතින් දක්වා ඇති රූප සටහන දෙස හොදින් බලන්න....ඔබ මෙම ජන ක්‍රීඩාව පිළිබදව දන්නවාද?

ඔව්....මෙම ජන ක්‍රීඩාව හදුන්වන්නේ ඔළිද කෙළිය ලෙසයි....

අපි දැන් ඔළිද කෙළිය පිළිබදව කරුණු විමසා බලමු......

## ඔළිද කෙළිය

මෙම ක්‍රීඩාව විශේෂයෙන්ම කාන්තාවන්ට සුවිශේෂ වූවකි.සිංහල අවුරුදු සමයේ විශේෂයෙන් කරනු ලබන ජන ක්‍රීඩාවක් ලෙස ඔළිද කෙළිය හැදින්විය හැකිය...එම ජන ක්‍රීඩාව ගෘහස්ථ ජන ක්‍රීඩාවකි..දෙදෙනෙක් දෙපල බෙදී ගෙන මෙම ක්‍රීඩාව කරනු ලබයි..ඔළිද කෙළිය සදහා යොදා ගන්නා උපකරණය ඔළිද පෝරුවයි....එය ඔළිද පෙත,ඔළිද කොළොම්බුව,මුතු පෝරුව,ආදී නම් වලින් හදුන්වයි..රජ බිසෝවරුන් මෙම ක්‍රීඩාවේ දී ඔළිද වෙනුවට මුතු භාවිත කළ නිසා මුතු පෝරුව යන නම යෙදී ඇත..



ඉහතින් දක්වා ඇත්තේ ඔළිද පෝරුවයි.....ඔළිද ක්‍රීඩාවේ යෙදෙන විට දෙපිලක් බෙදී ගීත ගායනා කරනු ලැබේ..ප්‍රශ්න හා පිළිතුරු දෙන ස්වරූපයකින් ගායනා කෙරේ.......

ක්‍රීඩාව ආරම්භ කිරීමට පෙර ගේ ගොම ගා ශුද්ධ පවිත්‍ර කර ක්‍රීඩා කරන අයද ඉස්හෝදා ස්නානය කර පිරිසිදු වීමෙන් දෙවියන් උදෙසා පුද පූජා පවත්වනු ලැබේ..ඒ බව මෙම කවියෙන් පැහැදිලි වේ..

ගෙවලුත් පළමුව ගොම මැටි ගාපු
නොයෙකුත් අය ඉස කන සෝ දාපු
වනමුත් රට පිට පිරුවට ඇද පු
හදුනුත් පිණිදිය තෙල් ගෙන ගා පු

පහතින් දක්වන ඔළිද කෙළියේ එන කවි කීපයකි...ඔබ එම කවි සටහන් කර ගන්න.....ගායනා කිරීමට උත්සහ කරන්න...

ඔළිද තිබෙන්නේ කොයි කොයි දේසේ
ඔළිද තිබෙන්නේ බංගලි දේසේ
ගෙනත් සදන්නේ කොයි කොයි දේසේ
ගෙනත් සදන්නේ සිංහල දේසේ

රන් ඇදිච්චද බල කොයි නෑනෝ
ගසට පලච්චද බල කොයි නෑනෝ
මල් හට ගත්තද බල කොයි නෑනෝ
පලු හට ගත්තද බල කොයි නෑනෝ

ඔළිද කඩන්නට මොකක් ගෙනෙන්නේ
රත්තරනෙන් රන් කෙක්ක ගෙනෙන්නේ
කෙක්ක කපන්නට මොකක් ගෙනෙන්නේ
රත්තරනින් රන් ගිරේ ගෙනෙන්නේ
ඔළිද නෙළන්නට මොකක් ගෙනෙන්නේ
රත්තරනින් රන් පෙට්ටි ගෙනෙන්නේ

(මැදුම් තනිතිත)

දොඩම් කපාලා ඇඹුල් තනාලා නාන්න යන සැටි බලන් කළු

සේලේ ඇදලා නෙරිය තියාලා මිදුලේ සක්මන් කරයි කළු

දහසක් දීලා වළලු තනාලා දෑතේ අතලා බලයි කළු

දුනුකේ මල සේ උළුගෙයි ඇද පිට ඔළිද කෙළින සැටි බලන් කළු

(මහ තනි තිත)

ක්‍රියාකාරකම්............

01...ඔබ දන්නා දේශීය ජන ක්‍රීඩා 5ක් ලියන්න..

02...ගෘහස්ථව සිදු කරනු ලබන ජන ක්‍රීඩා මොනවාද?

03...කාන්තාවන් පමණක් සහභාගී වන ජන ක්‍රීඩා මොනවාද?

04...ඔළිද කෙළිය සඳහා යොදා ගන්නා උපකරණය කුමක්ද?

05...ඔළිද කෙළියේ ගීත ගායනා කරන්න....